දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 04/2016

මගේ අංකය : ඩී1/විවිධ/2016,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2016/01/25

බන්ධනාගාර මූලස්ථානයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීවරුන් වෙත,

<u>බන්ධනාගාර නිලධාරීන් උසස් නිලධාරීන් හමුවීම</u>

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ඔවුන්ගේ ඥාතීන් හා හිතමිත්‍රාදීන් විධිමත් පූර්ව හෝ ලිඛිත අනුමැතියකින් තොරව, රේඛීය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ලේකම්තුමා සහ අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් හමුවීමට පැමිණෙන බැවින්, අදාළ මාණ්ඩලික නිලධාරීන්ගේ හා කාර්යාලයේ රාජකාරි කටයුතු සඳහා බාධා පැමිණෙන බව දැනගන්නට ලැබී ඇත.

02. එබැවින් මින් ඉදිරියේ දී, රේඛීය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ලේකම්තුමා, අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් හෝ වෙනත් දේශපාලන බලධරයෙකු හමුවන්නේ නම්, පහත පරිදි විධිමත් පරිදි ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය.

- බන්ධනාගාර ආයතනයක කටයුත්තක් නම් ආයතනය භාර බන්ධනාගාර අධිකාරිවරයා විසින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගෙන් විධිමත් පරිදි ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.
- කිසිම නිලධාරියෙකු විසින් සිදු කරනු ලබන කටයුත්තක් නම් අදාළ නිලධාරියා සේවය කරන බන්ධනාගාර ආයතනයේ බන්ධනාගාර අධිකාරි මඟින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගෙන් විධිමත් පරිදි ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.
- නිලධාරීන්ගෙන් සමන්විත සංගමයකට හෝ සමිතියකට අදාළ කටයුත්තක් නම් අදාළ සංගමයේ හෝ සමිතියේ සභාපති හෝ ලේකම් විසින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගෙන් විධිමත් පරිදි ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

03. ඉහත කරුණ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු චක්‍රලේඛ: 2009/24 සහ 2010/21 මඟින් ඔබ දැනුවත් කර ඇතත්, එහි නියෝග අනුව කටයුතු කර නොමැති බව පෙනී යයි. මින් ඉදිරියට ඉහත පරිදි කටයුතු නොකර, මෙම නියෝග පැහැර හරින නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව ද දන්වා සිටිමි.

04. තවද, තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බන්ධනාගාර ආයතනය භාර බන්ධනාගාර අධිකාරිවරයාගේ අනුදැනුමකින් තොරව ඉහළ බලධරයන් වෙත, නිලධාරීන් විසින් ස්වකීය අභියාචනා ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවයක් වර්ධනය වී ඇති බව ද නිරීක්ෂණය වේ. තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බන්ධනාගාර ආයතනය භාර බන්ධනාගාර අධිකාරිවරයා දැනුවත් නොකර, මින් ඉදිරියට ක්‍රියා කරන නිලධාරීන් හා අධීක්ෂණ නිලධාරීන් සම්බන්ධව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 06/2015 ප්‍රකාරව කටයුතු කරන බව ද වැඩිදුරටත් දන්වමි.

05. ඉහත කරුණු ඔබ ඇතුළු සෙසු සියළුම නිලධාරීන් හට බලාත්මක වන අතර, මේ සම්බන්ධයෙන් ඔබ අංශයේ/ආයතනයේ සේවය කරන සියළුම නිලධාරීන් දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.